**UNIVERSITY GRANTS COMMISSION**

# Finance Circular Letter No. 03/2013

2nd October, 2013

Vice-Chancellors of Universities,
Directors of Institutes,
Rectors of Campuses.

**Non-Remittance of Employees' Provident Fund (EPF) and Employees' Trust Fund (ETF) Contributions by Employees**

The Cabinet decision dated 22nd August, 2013 on the above matter is sent herewith for your information and implementation in the Universities and Higher Educational Institutions.

This circular letter is available on the UGC website www.eugc.ac.lk

Prof. (Mrs.) Kshanika Hirimburegama
Chairperson

Cc.
1. Secretary/MOHE
2. Vice-Chairman/UGC
3. Secretary/UGC
4. Additional Secretary/HR, IUA
5. Accountant/UGC
6. Registrars of Universities
7. Bursars of Universities
8. Snr. Asst./Asst. Registrars of Institutes/Campuses
9. Snr. Asst./Asst. Bursars of Institutes/Campuses
10. Snr. Asst. Secretary/Personnel/UGC
11. Chief Internal Auditor/UGC
12. Auditor General
13. Govt. Audit Superintendent/UGC
14. Govt. Audit Superintendent/Universities

රහසිගතයි.

**පිටපත්:** ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
ජ්‍යෙ.අමා. සඳහා වන
ලේ.කාර්.සම-ප්‍ර.වි.නි.
විගණකාධිපති.

මගේ අංකය: 13/විවිධ (027)
2013 අගෝස්තු මස 30 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

**ක්‍රියා කළ යුතු:** සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්.

**සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා**
**නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල්**
**<u>සේවා යෝජකයන් විසින් ප්‍රේෂණය නොකිරීම</u>**

2013 අගෝස්තු මස 22 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ඉ) වෙනත් කරුණු:**

61. **සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් සේවා යෝජකයන් විසින් ප්‍රේෂණය නොකිරීම** - භාණ්ඩාගාර අරමුදල් මත මුළුමනින්ම යැපෙන ආයතන ඇතුළු, ඇතැම් රාජ්‍ය ආයතන පවත්නා නීති උල්ලංඝනය කරමින්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත සිය සේවකයන්ගේ මාසික දායක මුදල් ප්‍රේෂණය කිරීමකින් තොරව, සිය ඉපයීම් හා වෙනත් ලැබීම් විවිධ කටයුතු වෙනුවෙන් වැයකර ඇති බවත්, එමඟින් සිය සේවකයන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී හිමි විය යුතු ප්‍රතිලාභ ඔවුනට අහිමිකර ඇති බවත්, අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට සිය අමාත්‍යාංශ ලේකම්වරුන්ට නියම කරන ලෙස අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්හට අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් දෙන ලදී:

(i) මෙම කරුණ පිළිබඳව සොයා බලා, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ප්‍රේෂණය කිරීමට අදාළ නියමයන් සපුරා නොමැති, සිය විෂයපථය යටතේ ඇති අදාළ ආයතන හඳුනා ගැනීම; සහ

→ 2.

(ii) ගෙවියයුතු හිඟ මුදල් කිසිවක් වේ නම්, ප්‍රමාදයකින් තොරව ඒවා පියවන ලෙසත්, විශ්‍රාම ගන්නා අවස්ථාවේදී අදාළ ප්‍රතිලාභ සේවකයන් වෙත හිමිවන පරිදි එම දායක මුදල් නියමිත වේලාවට ප්‍රේෂණය කිරීමට ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එකී ආයතනවල අදාළ බලධාරීන්ට උපදෙස් නිකුත් කිරීම.

ක්‍රියා කළ යුතු: **සියලුම අමාත්‍යාංශ**

පිටපත්: **ජනාධිපති ලේකම්**
**අග්‍රාමාත්‍ය ලේකම්**
**සම-ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා වන ලේකම් කාර්යාලය**

## (E) Any Other Business:

61. **Non-Remittance of Employees' Provident Fund (EPF) and Employees' Trust Fund (ETF) Contributions by Employers -** H.E. the President brought to the notice of the Cabinet that certain Government Institutions, including some which are totally dependent on Treasury funds, have spent their earnings and other receipts on various activities without remitting the monthly EPF and ETF contributions of their employees, violating the existing laws, thereby depriving the employees of their dues at their retirement. After discussion, H.E. the President advised the Ministers of the Cabinet to direct their Secretaries to Ministries -

(i) to look into this matter and identify the relevant institutions under their purview which have not fulfilled the necessary requirement relating to remittances of EPF and ETF contributions;

(ii) to issue instructions to the relevant authorities of the said institutions to settle the dues, if any, without delay and take necessary action to remit such contributions in time, in future, so that the terminal benefits would reach the employees.

Action by: **All Ministries**

Copied to: **Secretary to the President**<br>**Secretary to the Prime Minister**<br>**Co-CEO, Secretariat for Senior Ministers**